## රාජ්‍ය සම්මානනීය ලේඛිකා ස්වර්ණකාන්ති රාජපක්ෂගේ

# හිම කැට සෝපානය

රාජ්‍ය සම්මානනීය ලේඛිකා ස්වර්ණකාන්ති
රාජපක්ෂගේ
හිමකැට සෝපානය




කුඩා වියේදී නිවාඩුවට කොහේ හරි ''ගමනක්'' යාම අපේ දෙමව්පියන්ගේ පුරුද්දක් වී තිබිණ. එය බොහෝ විට ඔවුන්ගෙන් කෙනෙකුගේ ගම් පළාතට ගිය ගමනක් විය. එසේ ගිය විට ඒ පළාතේ සති කීපයක් රැඳී සිටීම සිරිතයි. මේ හැරුණු කොට මේ ගමන වන්දනා ගමනක් හෝ වෙනත් පළාතක සිටින නෑ මිතුරන් බැහැ දැකීමට ගිය ගමනක් විය. මේ කුමන ගමනක් වුවද අවසානයේ පෙරළා නිවහනට පැමිණි පසු අප විසින් කළ යුතු දෙයක් විය. ඒ ගමන පිළිබඳව රචනාවක් ලිවීමයි.

පසු කලෙක මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ ''කළුනික සෙවීම'' පොත කියැවීමේදී ද සිහිපත් වූයේ කුඩා කාලයේ අප ලියූ රචනායි. හුදෙක් කතාවක් කීමට වඩා පාඨකයින්ව වඩාත් දැනුවත් කරමින්, තමන් කතා කරන ක්ෂේත්‍රය පිළිබඳව කුතුහලය අවුලවමින් ලියැවුණ ''කළුනික සෙවීම'' අපව තව තවත් උනන්දු කරවීය. ඊට හේතුව වූයේ අදාල කතා වස්තුව ඉදිරියට ගෙනයාමටත් වඩා ඒ පරිසරය, වට පිටාව පිළිබඳව පාඨකයින්ට හුවා දැක්වීමට මාර්ටින් වික්‍රමසිංහයන් ගත් උත්සාහයයි. අප කුඩා කල ලියූ රචනා වසරින් වසරට පරිණත වූවානම් අප කියැවූ එවන් අගනා පොත පතින් ඇවිලුන කුහුල නිසා ම විය යුතුයි.

කෙසේ වුව ද මෙවන් මතකයක් පූර්විකාවක් ලෙසින් ලිවීමට යෙදුනේ එකී අරමුණෙන්ම ලියන්නට ඇතැයි සිතිය හැකි මෑත කාලීන නව කතාවක් වෙනුවෙනුයි. මව් බිමේ රාජ්‍ය සම්මානයන්ගෙන් කීප වතාවක්ම පිදුම් ලද ස්වර්ණකාන්ති රාජපක්ෂ ප්‍රවීන ලේඛිකාවගේ ''හිම කැට සෝපානයය'' ය වී. අපට නුහුරු පරිසර තත්ත්ව තුල නුහුරු අත්දැකීම් පෙළක් එකිනෙක අමුණා අපව රඳවා තබා ගැනීමට ලේඛිකාව සිය පරිණතව ගිය හුරුව කදිමට හසුරුවාගෙන ඇති සේ ය.

ග්‍රන්ථයේ නමින් ම මේ නව කතාව ලියැවෙන්නේ අපට නුහුරු පරිසරයක් පිළිබඳව විය හැකියැයි අනුමානයකට අපව යොමු කෙරෙයි. පරිච්ඡේද අංකයක් නොමැති ප්‍රවිෂ්ඨය ඒ බව සනාථ කරවන්නේ විදෙස් නම් හා සෘතු පිළිබඳව කෙටි ඉඟි ඇසුරෙනි.

ඇද අකුරින් මුද්‍රණය වී ඇති එම ප්‍රවිෂ්ඨය සැබැවින් ම මේ කතාවේ වර්තමානයයි. අනතුරුවයි පරිච්ඡේද සහිතව අතීතාවර්ජනයකට ප්‍රධාන චරිතය වන උමා එළැඹෙන්නේ.

විදේශ ගතව, උගෙන, රැකියාවක් කිරීමේ නොනිත් ආශාවෙන් පෙළුණ යෞවනියකගේ කතාවකුයි මේ. ගම්බද මධ්‍යම පාන්තික පවුලක දියණියක වන ඇය සිය අභිමතාර්ථයන් සපුරා ගන්නා ආකාරය පාඨකයා වෙත කතුවරිය ගෙන එන්නේ සරළ සුගම රචනා ශෛලියක් අනුගමනය කරමින්. ඉතා කෙටි පරිච්ඡේදවලට සිය කතාව ගොනු කරමින් ඉදිරියට ලියාගෙන යාම, ඒ සඳහා ඇය ගත් සාර්ථක ක්‍රමවේදයක් බැව් කියවාගෙන යාමේදී සපථ වෙයි. සැබැවින්ම එය රූපාවලි කෙටියෙන් ඡේදනය වෙමින් ඉදිරියට ගලා යන සිනමා පටයක් වැන්න.

මේ 1965 වර්ෂයයි. තමා ඉතිරි කරගත් මුදලත්, දෙමාව්පියන් ඇය වෙත ලබා දුන් මුදලත් පිරිමසාගෙන කටයුතු කිරීමෙන් උමා ප්‍රංශයට යාමට තෝරාගන්නේ ගුවන් ගමනක් නොව, මුහුදු ගමනකි. වරායෙන් නෞකාගත වන ඇයගේ අත් දැකීම් පාඨකයින් සමග බෙදා හදා ගැනීමට කතුවරිය සිය නවකතාවේ ජරිච්ඡේද හතක් ම වෙන් කිරන්නීය. සිය විසි එක්වන උපන් දිනයේදී නෞකාවකට ගොඩවන උමාගේ සති තුනක වෙහෙසකර මුහුදු ගමන පිළිබඳව කතුවරියට ලිවීමට ඇති දේ පරිච්ඡේද හතක් පුරාවට ලියැවුණ ද එය පාඨකායාට වෙහෙසකර නො වන සේ ලිවීමට වග බලාගන්නී, පරිච්ඡේද කෙටි කරවන්නී ය. නෞකාවක විදෙස් ගත වීම වෙනත් රටකට ගුවනින් සංක්‍රමණය වූ අපට නැවුම් අත් දැකීමක් වුවද, කතාවේ ඇතැම් දේ අපහට ද අදාල වෙයි. නැව් තොටට ගමේ සිට නෑ පිරිවර සමග ආ ගමන, වෙන් වීම, තනි වීම, මගදී හිතෛශීන් හඳුනා ගැනීම, අතරමග නැවතුම් පොළවල්වල අත් දැකීම්, නව දේශගුණික හා අනෙකුත් පාරිසරක තත්ත්වවලට හුරු වීම්, නව ගමනාන්තය, එහි හඳුනාගැනීම්, විප්‍රවාසී වූ අප හට ද වෙනත් ආකාරයකින් දැනෙයි. සැබැවින් ම උමා චරිතයෙන් කතුවරිය මේ බෙදා හදා ගන්නේ ඇයගේ ම අත්දැකීම් ද?

ළමා වියේදී අප ''කළුනික සෙවීම'' කියවා ලැබූ සේම කතුවරිය පාසලේ දී උගත් විෂයන්ගෙන් ලොව පිළිබඳව දැනගන්නට, ලොව දැකගන්නට ලැබූ කුහුල පිළිබඳව ඈ මෙහිදී සටහන් තබන්නේ අද වන විට සිසු දරුවන් හට මගහැරී ගිය ඉසව් ගැන සිහිපත් කරමිනි. මගදී ඇයට ගොඩබැසීමට ලැබෙන නගර, එවකට ඒවායේ තිබූ සමාජ විෂමතා පිළිබඳව ද අපව දැනුවත් කරීමට ඇය සුළුවෙන් හෝ ඉසිඹුවක් ලබා ගන්නී ය.

''රෙස්ටොරන්ට් ඕපන් ඔන්ලි ෆෝ වයිට් පීපල්, නොට් ෆෝ බ්ලැක් ඩෝග්ස්''

මේ ඇය කේප් ටවුන්හි ආපන ශාලාවක දුටු දැන්වීමකි. කෙසේ වුවද කතුවරිය ඒ නගරය 1965 වසරේදී දකින්නේ;
''මේ අතින් බැලූ විට අපේ කොළඹ නගරය සුරපුරක් නො වේදැයි සිතෙද්දී මගේ හදමඩල හැඟුම් බර වී ගියේය'' යනුවෙනි.
ඇය අනෙකෙකුගේ මුවින් මෙලෙසින් ප්‍රකාශ කරවන්නේ ද ඇය සිත තුළින්ම නැගෙන අදහස් නොවේද ?
''උන්ගෙ ඊනියා හිරු නොබසින අධිරාජ්‍යයේ පම්පෝරිය ලෝකෙට පෙන්නුවේ එහෙම තමයි. ඉතින් අපේ තියෙන ලැජ්ජා නැතිකමට අපි දැන් උන්ගෙ දෙපතුල් ළඟට ගිහිල්ලා උන්ගේ අත පල්ලෙන් වැටෙන කීයක් හරි අරගන්නයි මේ දහ දුක් විඳගෙන නැව් නැගලා යන්නේ. ''

ප්‍රංශයේ අධ්‍යාපනය සහ රැකියාවක් පතා යන ''-උමා'' චරිතය ගොඩ නංවන කතුවරියමයි මේ ඊට විරුද්ධ ආකල්පයක් දක්වන්නේ. ඒ මුහුකුරා ගිය ලේඛිකාවගේ ස්වභාවයයි. මේ කතාව ඇය පෙම් රැල්ලකින් ද දවටාලන්නේ ඊට කැමති රසිකාගාරය බඳවා ගැනීමේ ක්‍රමවේදයක් ලෙසින් ද ?

''සුමනගේ ආරාධනාත්මක දිගු බැල්ම මගහැර සිටීම පහසු කටයුත්තක් වූයේ නැත''

........ බාහිර වශයෙන් අචංචලව සිටි සෙයක් පෙන්වුවද යටි සිතින් එම ආශ්වාදයට වඩ වඩාත් සමීප වෙමින් සිටි නිසාය''
''......දිගු ඇසි පිහාටු සහිත දුඹුරු පැහැති දිදුලන දෑස් බුද්ධිමත්ය.''

මේ කතුවරිය ආදරවන්තයෙකු හා ආදර ප්‍රවිශ්ඨය ලියනා අන්දමයි. ඉහත දැක්වූයේ උපුටනයක් දෙකක් පමණකි. කතුවරිය මෙහිදී යොදා ගන්නා උපමා රූපක විවිධාකාර වෙයි.

''ඔවුන්ගේ බස නම් මට අණ්ඩර දෙමළයකි.''
''එනමුදු ගලිවරයෙකු ලෙසින් පෙනෙන ඔහු....''

''සමහරුන්ගේ මුහුණු තම්බපු ඉස්සන් වාගේය. නැතිනම් ගෝවා ගෙඩි සේ සුදුමැලිය. සමහරු කිරි දියර පාටය. බොහෝ ලා බාල තරුණ තරුණියන් සහ ළමුන්ට රෝස මල් පෙති සේ පියකරු සිනිදු සම ඇත්තේය.''



සිසිර දිසානායක

''සත්ත්ව උද්‍යානයේ කූඩුවක එල්ලී නරඹන්නන් දෙස කුහුලින් යුතුව බලා සිටින වැඳිරියක වාගේය''

''හද පුරා බුබුළු දමන චකිතයෙන්''
''ඇස් මානයේ දිළෙන මරකත මිණි පැහැය.''

එමෙන් ම චරිත නිර්මාණය කිරීමේදී කතුවරිය යොදා ගන්නා යෙදුම් එම චරිත විකාශනයෙහි ලා ඉමහත් බලපෑමක් ඇති කරවයි.
''මන්දස්මිතිය ඇගේ මුව මඩල හැරදා යන්නට ගියේ ම නැත.''
''මගේ උදරය ප්‍රදේශයෙන් නැගී කැලතී කැලතී ගමන් කල යම් හැඟුමක් දිග සුසුමක් ලෙසින් පිටව ගියේය.''

''මම නිහඬව හිනැහුනෙමි.''
''අම්මාගේ කට කොනක් ඇද විය.''
''ආත්ම විශ්වාසය මගේ ගිනිගත් සන්තානය මතට පතිත වූ පොද වැස්සක් වූයේය.''

විප්‍රවාසී වූ උමාගේ කතාවයි ''හිමකැට සෝපානය''. මේ කතාවේ නුහුරු පරිසර තත්වයන් යටතේ ඇයට හමුවන පුද්ගල චරිත, කෑම බීම, ආයතන, වටපිටාවන් හා අත්දැකීම් ස්වර්ණකාන්ති රාජපක්ෂ කතුවරිය සවිස්තරාත්මකව ගොනු කරන්නේ කා හටත් ගැලපෙන සරළ එහෙත් අති සරළ නොවින භාෂා රීතියකිනි. පරිසරය පිළිබඳවත්, පුද්ගල චරිත පිළිබඳවත් සවිස්තරාත්මකව ලියා අප වෙත දැක්වීමට ඇය වඩාත් උනන්දුවූවා සේය. එරට ගම්බද ගොවිපළක ගොවි නිවෙසක නිවාඩුව ගත කරන උමා අපට පරිසරය මතු නොව, ගැමි මානව සබඳතා, ආර්ථිකය හා සමාජයීය තොරතුරු ද මනා සේ කියා පාන්නීය.

සමස්තයක් වශයෙන් ගත් කළ කතුවරිය විප්‍රවාසී අප වෙත අපහට අදාල මාතෘකාවක් ඔස්සේ ධනාත්මක මානයකින් සිය අදහස් ඉදිරිපත් කරන්නීය. එසේ වුව ද තමා මුහුණ දුන් අභියෝග පිළිබඳව ලියවුණා ප්‍රමාණවත් ද යන්න ගැටළුවකි. භාෂාව නොහුරුකමින් තමන් හදාරන විෂයන්වලින් අඩු ප්‍රතිඵල ලැබීමත්, අවසන තමන්ට රැකියාවක් ලබා ගැනීමට වූ අපහසුවත් මෙහිදී අභියෝග ලෙස පෙනී යයි. එහෙත් ඒවා ඇය ජය ගන්නා අන්දම මීට වඩා බැරෑරුම් ලෙස ලියා පෑවා නම් එය යථාර්තයට වඩාත් සමීපවනු ඇතැයි අපගේ පුද්ගලික අදහසයි. මෑතකදී කියවන්නට ලැබුණු උදිත අලහකෝන්ගේ පරිවර්තනයක් වූ තිරු පුර සුන්දරි (ලක්ෂ්මී) ගේ ''කාවේරි'' නව කතාව සිහිපත් වෙයි. මෙම දෙමළ නව කතාව සාහිත්‍ය ඇකඩමි සම්මාන ලද්දකි. ඉන්දියානු සම්භවයක් ඇතිව අප්‍රිකානු රටක උපදින කාවේරි ඉන්දියාවට යන්නේ සිය මුතුන්මිත්තන් දැකගැනීමට නිවාඩුවක් සඳහායි. ඇයගේ අත්දැකීම් කතුවරිය බෙදා හදාගන්නා ආකාරය සිහිපත් වේ.

ස්වර්ණකාන්ති රාජපක්ෂ කතුවරියගේ ''හිම කැට සෝපානය'' වඩාත් සමීප වන්නේ ''මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ''කළුනික සෙවීම'' වැනි ගවේෂනාත්මක සහ විස්තරාත්මක රාමුවක ලියැවුණ නව කතා ගණයට යැයි සිතේ.

